# 7

# පුරාතන ශ්‍රී ලාංකේය ඉතිහාසකරණ සම්ප්‍රදායෙහි ආරම්භය සහ අනුක්‍රමික වර්ධනය

සුපුන් ගයාන් විජේරත්න එස්. ඩබ්. / පියුමි හංසිකා සමරනායක පී. ඩබ්.

**සංක්ෂේපය**

ඉතිහාසය ලිවීමේ ශික්ෂණය හෙවත් ක්‍රමවේදය, ඉතිහාසකරණය ලෙසට හඳුනාගත හැකි අතර ලොව බොහෝ රටවල අතීතයේ සිට ඉතිහාසය රචනා කිරීමේ විවිධ සම්ප්‍රදායන් පැවති ආකාරය හඳුනාගත හැකි වේ. ලොව වෙනත් රටවල ඉතිහාසකරණයන් හා සසඳන විට පුරාතන ශ්‍රී ලාංකේය ඉතිහාසකරණ සම්ප්‍රදාය අඛණ්ඩව පැවතගෙන පැමිණියක් ලෙස හඳුනාගත හැකි වේ. මෙම පර්යේෂණයේ ගැටලුව ලෙස පුරාතන ශ්‍රී ලාංකේය ඉතිහාසකරණ සම්ප්‍රදායේ ආරම්භය හා වර්ධනය කෙබඳු වූයේ ද ? යන්න පෙන්වා දිය හැකිය. මෙහිදී පුරාතන ශ්‍රී ලාංකේය ඉතිහාසකරණ සම්ප්‍රදායේ ආරම්භය හා ඒ කෙරෙහි බලපෑ සාධක පිළිබඳ විමසා බැලීම ද, පුරාතනයේ ඉතිහාසකරණ සම්ප්‍රදායේ අනුක්‍රමික වර්ධනය සිදු වූ ආකාරය පිළිබඳ විමසා බැලීම ද, ඉතිහාසකරණ ශික්ෂණය කෙරෙහි බලපෑ අවශේෂ සාධක පිළිබඳ විමසා බැලීම ද අරමුණු වෙයි. උක්ත පර්යේෂණ ගැටලුව සාධනය කරගැනීමේදී ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය භාවිතා කරන ලද අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුගතව පුස්තකාල පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ප්‍රාථමික හා ද්විතියීක මූලාශ්‍ර පරිශීලනය කරමින් දත්ත රැස් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම හා නිගමනවලට එළඹීමේ ප්‍රවේශය භාවිතා කරන ලදී. පුරාතන ශ්‍රී ලාංකේය ඉතිහාසකරණ සම්ප්‍රදායෙහි ආරම්භය පිළිබඳ විමසන විට එය බෞද්ධ විහාරාරාම කේන්ද්‍ර කර ගනිමින් ආගමික අරමුණු හා සම්බන්ධ රචනාවන් ඔස්සේ සිදුවන ආකාරය ඉස්මතු වේ. මෙහිදී බෞද්ධ භික්ෂූණ් මූලිකත්වය ගෙන කටයුතු කර ඇති අතර ආගමික අරමුණු මූලික කරගෙන රචනා වුව ද ඓතිහාසික කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් තත්ත්වයකි. මෙරට ඉතිහාසකරණ සම්ප්‍රදායෙහි අනුක්‍රමික වර්ධනය පිළිබඳ විමසන විට ආගමික අරමුණු හා සමගාමී වන ආකාරයෙන් විවිධ අංශයන් ගණනාවක් හා සම්බන්ධ විවිධ රචනාවන් රාශියක් ඉදිරියට පැමිණෙන ආකාරය ද, ඒවායෙහි දී අදාළ කරුණුවල වලංගුභාවය හා නිරවද්‍යභාවය වැඩිවන ආකාරයෙන් ඉදිරිපත් කිරීම සඳහා ඓතිහාසික කරුණු අන්තර්ගත කර තිබීම ද, එකී රචනාවන් කෙරෙහි රචකයන්ගේ ආශයන් හා අවශේෂ සාධක ගණනාවක් බලපා තිබෙන ආකාරය ද හඳුනාගත හැකි වේ.

**මුඛ්‍ය පද - පුරාතන ශ්‍රී ලංකාව, ඉතිහාසකරණය, ආගමික ග්‍රන්ථ, වංසකතා සාහිත්‍ය, මහාවිහාර සම්ප්‍රදාය**

**හැඳින්වීම**

මිනිසා විසින් මුල් කාලීනව ස්මරණය මගින් තම දැනුම පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබූ අතර පසුව අතීත සිදුවීම් පිළිබඳ දැනුම පවත්වාගෙන යාමට විවිධ ගුරුකුලයන් හෝ සම්ප්‍රදායන් ඉදිරිපත් වන ආකාරයක් හඳුනාගත හැකිය. මෙලෙස අතීත සිදුවීම් අනාගතයේදී යම් යම් අවස්ථාවල ප්‍රයෝජනයට ගැනීම අරමුණු කරගෙන ජනකතා ස්වරූපයෙන් ඉදිරියට පවත්වාගෙන යාමට මානවයා කටයුතු කළ අතර එම සිදුවීම්වලට ආකර්ශනීය බවක් ආරෝපණය කරමින් පුද්ගලයන් තුළ ආශාව හා කුතුහලය ඇති කරමින් එම තොරතුරු අනාගතය වෙත රැගෙන යාමට උත්සාහ කළහ. ආගමික සාධකය මේ කෙරෙහි ප්‍රබල තල්ලුවක් ලබා දීමට සමත් වූ අතර සමාජයේ වැදගත් තත්ත්වයෙහිලා සැළකුණු පුද්ගලයන් හෝ සිදුවීම් වටා ගෙතී ඇති විවිධ කතා පුවත් මෙහිදී ප්‍රධාන වූ බව පැහැදිලි වේ. මුල් කාලීනව ශික්ෂණයකින් තොරව කතා ඉදිරිපත් කිරීමේ සම්ප්‍රදායක් පමණක් සෑම සමාජයක ම ඉතිහාසකරණය විමසන විට හඳුනාගත හැකි වන අතර කල් ගතවන විට එකී කතා කීමේ සම්ප්‍රදායෙන් ඔබ්බට ගොස් සැබෑ ඓතිහාසික සිදුවීම්, පක්ෂග්‍රාහීත්වයෙන් තොරව, විශ්ලේෂණාත්මක ලෙස ඉදිරිපත් කිරීමේ වැදගත්කම අවබෝධ කරගත් ඉතිහාස රචකයන් ශික්ෂණයන් අනුව තම රචනාවන් සිදු කිරීමට කටයුතු කරන බව පැහැදිලිව හඳුනාගත හැකිය. එමෙන්ම ලේඛන ක්‍රමයන්හි දියුණුවත් සමඟ එකී තොරතුරු සංගෘහිත කිරීම ද සිදුවීම වැදගත් විය. මෙලෙස ලොව විවිධ භූමි කලාපයන් කේන්ද්‍ර කරගනිමින් අතීත සමාජ තුළ ඉතිහාසකරණ ශික්ෂණ ආරම්භ වී වර්ධනය වීම සිදු වේ. දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකාවේ ද අතීත සමාජය තුළ මෙවැනි ඉතිහාසකරණයක් හඳුනාගත හැකි අතර බුදු දහමේ බලපෑමත් සමඟ එය අඛණ්ඩව බොහෝ කාලයක් පුරා වර්ධනය වෙමින් ඉදිරියට පැමිණ ඇති බව දක්නට ලැබෙන අතර එහි වැදගත් ලක්ෂණ ගණනාවක් ද හඳුනාගත හැකි වේ. නූතනය වන විට ලොව වෙනත් බොහෝ රටවල මෙන් ශ්‍රී ලංකාවේ ද ඉතිහාස ශික්ෂණය පිළිබඳ අවධානය වැඩි වශයෙන් යොමු වී තිබෙන අතර ශ්‍රී ලංකාවේ ඉතිහාසකරණයේ ආරම්භය, වර්ධනය පිළිබඳ මෑත කාලය වන විට අධ්‍යයනයන් ගණනාවක් සිදු වී තිබේ. මෙහිදී රණවීර ලෙස්ලි ගුණවර්ධන මහතා විසින් සංස්කරණය කරන ලද ඉතිහාසයේ අතීතය ශික්ෂණයක වර්ධනය පිළිබඳ විමර්ශනයක් කෘතිය ප්‍රමුඛ කොටගත් තවත් විද්වතුන් ගණනාවක් විසින් රචනා කර තිබෙන ලිපි හා කෘති ගණනාවක් හඳුනාගත හැකි වේ. මේවා තුළින් ඉතිහාසය ලිවීම පිළිබඳ නවමු දෘෂ්ටිකෝණයකින් විමසා බැලීම ඉතාමත් වැදගත් ය.


**ක්‍රමවේදය**

මෙම පර්යේෂණයේදී ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය භාවිතා කරන ලදී. එහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුගතව යමින් පළමුව පුස්තකාල පර්යේෂණ ඔස්සේ ප්‍රාථමික මූලාශ්‍ර පරිශීලනය කරමින් දත්ත රැස් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීමත් ද්විතියික මූලාශ්‍ර පරිශීලනය කරමින් දත්ත රැස් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීමත් සිදු කරන ලදී. අනතුරුව ක්‍රමානුකූලව පෙළගැස්වීම සිදු කළ අතර පසුව නිගමනවලට එළඹීම සිදු කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

### ඉතිහාසය හා ඉතිහාසකරණය

ඉතිහාසය හා ඉතිහාසකරණය වූ කලී එකිනෙකට වෙනස් අවස්ථා දෙකකි. ඉතිහාසය තුළින් අතීත සමාජයන්හි දේශපාලන, සමාජ, ආර්ථික, ආගමික හා සංස්කෘතික සන්දර්භයන් පිළිබිඹු කරනු ලබන අතර ඉතිහාසකරණය යනු ඉතිහාසය පිළිබඳ ලියූ රචනාවන්ය. මෙහිදී එකී ඉතිහාසය ලිවීමේදී අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදයන් පිළිබඳ විමසා බැලීම සිදු කරයි. "ඉතිහාසය" යන්න අරුත් ගැන්වීම සඳහා විවිධ පුද්ගලයන් විවිධ නිර්වචන ඉදිරිපත් කර තිබේ. පෙරදිග දී භාවිතා කරන "ඉතිහාස" යන්න සඳහා බටහිර දී භාවිතා කරන "History" යන පදය සාධාරණ ද යන ප්‍රශ්නය වියතුන් විසින් ඉස්මතු කර තිබේ. කෙසේ වුවද අතීත මිනිසුන්ගෙන් ශේෂව තිබෙන්නා වූ කරුණු කෙරෙහි අවධානය යොදවමින් තම ඥානය මඟින් පරිකල්පනය මත ගොඩනගන අතීතයේ ප්‍රතිබිම්බය ඉතිහාසය ලෙස සැලකීමේ හැකියාව පවතී. අතීතයේ සිදු වූ සියලු ප්‍රපංචයන් ඉතිහාසය විෂයට හසු නොවන අතර මානවයා හා බැඳී තිබෙන මානව වර්ගයාට ප්‍රයෝජනවත් ප්‍රපංචයන් ඉතිහාසයේ දී අධ්‍යයනය කරයි. අතීත මානව අත්දැකීම් පිළිබඳ ඥානය වර්තමාන හා අනාගත මානවයාට ලබා දීම ඉතිහාසයේ කාර්යය ලෙස හඳුනාගත හැකි ය. එහිදී කාලය හා අවකාශය මත පිහිටමින් ඉතිහාසඥයා තොරතුරු විද්‍යාත්මකව අධ්‍යයනය කරමින් තම පර්යේෂණ කරුණු ලියා දැක්වීම ඉතිහාසකරණය ලෙස හැඳින්වේ.




ඡායාරූපය 01 - ඉතිහාසකරණය

ඉතිහාසය ලිවීමේ ක්‍රමය ඓතිහාසික සම්ප්‍රදාය ලෙස ද හඳුන්වයි. ඉතිහාසය ලිවීමට මිනිසා යොමු වූයේ පසුගිය සිදුවීම් සම්බන්ධයෙන් දැන ගැනීමට වූ කුතුහලය නිසාවෙනි. විවිධ ජාතීන් අතර ඉතිහාසය ලිවීම පිළිබඳව විවිධ ක්‍රම පැවතුණු බව හඳුනාගත හැකිය. ඉතිහාසය ලිවීම සම්බන්ධයෙන් ආරම්භය සනිටුහන් කරන ලද්දේ ග්‍රීක ජාතිකයන් ද චීන ජාතිකයන් ද යන්න පිළිබඳව තවමත් නිශ්චිත එකඟතාවක් නොමැත. හෙරඩෝටස් සහ තුසිඩිඩීස් ග්‍රීක ඉතිහාසකරණයේ ආරම්භකයින් අතර ප්‍රමුඛයන් ලෙස හඳුනාගත හැකිය. "සිදුවීම් සිදුවන්නේ එක්තරා රටාවකට ය." යන සංකල්පයේ පිහිටමින් ඔවුහු ඉතිහාසකරණයේ නියැලී තිබේ. (පීරිස්, 2005) චීනය දෙස අවධානය යොමු කරන විට ස-මා-චියන් විසින් ඉහළට ඔසවා තැබූ ඉතිහාසකරණ සම්ප්‍රදාය තවත් අය විසින් ඉදිරියට පවත්වාගෙන යන ලදී. (වේරකේ, 2005) ඉන්දියාව පිළිබඳ විමසන විට අඛණ්ඩව ගලා ආ ඓතිහාසික සම්ප්‍රදායයක් හඳුනාගත නොහැකි වුවද මුල් කාලීනව සිට විවිධ තොරතුරු පවත්වාගෙන ඒමේ ක්‍රමෝපායන් පැවති අතර එහිදී පුරාණ ග්‍රන්ථ සම්ප්‍රදාය, ශ්‍රමණ සම්ප්‍රදාය, පුද්ගල චරිත අලලා ලියැවුණු රචනාවන් ආදිය පැවතගෙන විත් කල්හන වැනි පුද්ගලයන් අතින් ඉන්දියාවේ විවිධ ප්‍රදේශවල ඉතිහාස කෘති බිහිවනු හඳුනාගත හැකිය.

(ගුණවර්ධන, 2005) එමෙන්ම අරාබියේ ඉබ්න් බල්ලුන් හා අල්බිරූනි වැන්නන් යටතේ ද බටහිර ආසියානු ප්‍රදේශවල ද තවත් ඉතිහාසකරණ සිදුවිය. (කරුණාතිලක, 2005) අපරදිග ප්‍රදේශ දෙස විමසන විට පළමුව ග්‍රීකයේ හෙරඩෝටස්, තුසිඩිඩීස් වැන්නන් යටතේ ද අනතුරුව රෝමයේ සීසර්, සැලස්ට්, ලිවී, ටැසිටස් වැන්නන් යටතේ ද ඉතිහාසකරණ සම්ප්‍රදායන් වර්ධනය විය. (අමරසිංහ, 2005) මෙලෙස ලෝකයේ විවිධ ප්‍රදේශවල ඉතිහාසකරණ සම්ප්‍රදායන් වර්ධනය වූවා සේම ශ්‍රී ලංකාවේ ද ඉතිහාසකරණ සම්ප්‍රදායක් අඛණ්ඩව වර්ධනය වනු හඳුනාගත හැකි වේ. ක්‍රිස්තියානියේ ව්‍යාප්තියත් සමඟ බටහිර ලෝකයේ ඉතිහාසකරණයේ යෙදුණේ ස්වර්ග රාජ්‍යය අරමුණු කරගත් මිනිසුන්ගේ ඉතිහාසය ලියා තැබීමක් වශයෙනි. (ගුණවර්ධන, 2005) ක්‍රි. ව. 18 වන සියවසෙන් පසුව මෙම ඓතිහාසික සම්ප්‍රදාය වෙනස් වන්නේ හේගල් සහ මාක්ස්ගේ අදහස් ව්‍යාප්තවීම සමඟය. (ගුණවර්ධන, 2005) විවිධ රටවල විවිධ වූ ඉතිහාසකරණ සම්ප්‍රදායන් පවතින බවක් පැහැදිලිව හඳුනාගත හැකිය. ඒ ඒ ජාතීන් තම රටෙහි ඉතිහාසය අඛණ්ඩව වාර්තා කරමින් පවත්වාගෙන යාමට දරන ලද උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස ද මෙය හඳුනාගත හැකි වේ. ඉතිහාසය ගොඩනැඟීමේදී මෙකී ඉතිහාසකරණ සම්ප්‍රදායයන්ට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි.

තම දේශයන්හි ඉතිහාසය වාර්තා කරමින් අඛණ්ඩව පවත්වාගෙන යාමේ ප්‍රමුඛයන් ලෙස චීනය සහ ශ්‍රී ලංකාව හඳුනාගත හැකි බව ලෙස්ලි ගුණවර්ධන මහතා සඳහන් කරයි. (ගුණවර්ධන, 2005) ශ්‍රී ලංකාව අඛණ්ඩව තම ඉතිහාසය වාර්තා කරමින් පවත්වාගෙන යාමට ක්‍රියා කර තිබේ. වංසකතා මෙන්ම ශ්‍රී ලංකාවේ ඉතිහාසයේ ලියවී ඇති කෘති ගණනාවක් ම තවමත් ශේෂව පැවතීම ඉතිහාසඥයන්ට සිය කටයුතු ඉදිරියට ගෙන යාමට ඉමහත් පිටිවහලක් වී තිබේ. ශ්‍රී ලංකාවේ ඉතිහාස තොරතුරු ඇතුළත් මුල් ම කෘති නූතනය වන විට විද්‍යමාන නොවුණ ද පසුකාලීන කෘතිවලින් ඒවා නාමමාත්‍රිකව හෝ හඳුනාගැනීමේ හැකියාවක් තිබේ. ඒවා ඉතිරි වී නොතිබුණ ද ඒවායේ අන්තර්ගත තොරතුරු බොහොමයක් පසුකාලීන මූලාශ්‍ර ආශ්‍රය කරගෙන ඇති බව පැහැදිලිව හඳුනාගත හැකිය. මෙරට ලියැවුණු අතීත වංසකතාවන්හි අන්තර්ගතව ඇත්තේ කලින් කල රට තුළ සිදු වූ ආගමික වූත් ඓතිහාසික වූත් සිදුවීම්ය. ඒ සඳහා පුද්ගලයන්, පූජා වස්තු සහ පූජනීය ස්ථාන පාදක කරගෙන තිබෙන බව පැහැදිලිය. මෙවන් ඓතිහාසික තොරතුරු රචනා වීම ආරම්භ වූයේ කෙසේ ද යන්න විමසා බැලීම ඉතාමත් වැදගත්ය.

**ශ්‍රී ලංකාවේ ඉතිහාසකරණ සම්ප්‍රදායේ ආරම්භය**

සංස්කෘත සාහිත්‍ය තුළ සඳහන් වන පුරාණ ග්‍රන්ථ යනු ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු සම්පාදනය සඳහා හේතු වූ බව ඒවායේ සන්දර්භය, ආකෘතිය හා අභිමතාර්ථ විමසීමට ලක් කළ ඇතැම් අයගේ අදහස විය. (මහාවංස ගීතය, 1993) පුරාණ යනු භාරතීය දෙවිවරුන්ගේ චරිත කතාවන් ය. එකී චරිත ප්‍රස්තුත කොට ගත් එම පුරාණ ග්‍රන්ථවල අන්තර්ගත මුඛ්‍ය ලක්ෂණ 5 ක් සර්ග (ලෝකයේ ආරම්භය), ප්‍රතිසර්ග (ලෝකයේ විනාශය හා නැවත අරම්භ වීම), මන්මන්තරානි (යුගයන්), වංස (දෙවියන්, ඍෂිවරුන්, රජුණ්ගේ වංශයන්), වංසානුචරිත (අතීත පුද්ගල චරිත) ලෙස දැක්වෙන අතර ඒවායින් වංස හා වංසානුචරිත යන ලක්ෂණ ද්විත්වය ඓතිහාසික තොරතුරු සම්පාදනය කෙරෙහි බලපෑම් කළ බව පෙන්වාදී තිබේ. (ගුණවර්ධන, 2005) පුරාණ ග්‍රන්ථවල සන්දර්භය පමණක් සැලකිල්ලට ගනිමින් ඓතිහාසික තොරතුරු සම්පාදනයේ දී එහි ආභාෂය ලබන්නට ඇතැයි පවසන ඇතැම් විචාරකයින් ඔවුන්ගේ මතය සනාථ කිරීම සඳහා සාධක කීපයක් ද ඉදිරිපත් කරයි. ඒ අනුව පළමු සාධකය නම් පුරාණයන්හි විෂ්ණු ආදී දෙවිවරුන්ගේ කතා

ප්‍රකාශ වීමයි. දෙවැන්න නම් ඒවා පද්‍ය භාෂාවෙන් රචනා වීමයි. පුරාණයන්හි අදහස ද වංසාදිය ප්‍රකාශ කිරීම හෙවත් පරම්පරා කතා ඉදිරිපත් කිරීමයි. (තිලකසිරි, 1960)

මේ අනුව සංස්කෘත වෛදික සාහිත්‍යයේ සඳහන් වන ඇතැම් කරුණු ද පුරාණ හා එහි එන කරුණු ද සලකා බැලීමේදී ඓතිහාසික තොරතුරු සම්පාදනයේ ප්‍රභවයට සංස්කෘත සාහිත්‍යය මගින් යම් ආලෝකයක් ලැබී තිබෙන බව ගම්‍යමාන වේ. එහෙත් පුරාණ ග්‍රන්ථ අනුගමනය කොට ලංකාවේ ඓතිහාසික සම්ප්‍රදාය ආරම්භ වී ඇතැයි විචාරකයන් අදහස් කළ ද එය සනාථ කළ හැකි මතයක් නොවන බව පැහැදිලිය. ඉහත දැක් වූ ලෙසට සංස්කෘත ආභාසය දක්වමින් ඉතිහාස රචනය පිළිබඳ ආභාසය ඉන්දියාවෙන් ලංකාවට ලැබුණු බව ඇතැමෙක් පිළිගනී. (කිරිබමුණේ, 2005) එයට හේතුව ලෙස ඔවුන් දක්වන්නේ පාලි වංසකතා සියල්ලක් ම සම්පාදනය කිරීමේ ගෞරවය බෞද්ධ ආචාර්යවරුන්ට හිමිවන නිසාය. (ධම්මරතන හිමි, 2009) නමුත් ඉන්දියාව තුළ සමස්ථ ඉන්දියාවම නියෝජනය වන ජාතික ඉතිහාසකරණයක් බිහි වී නොමැත. ඉන්දියාවේ ඉතිහාසය අන්තර්ගත පැරණි කෘතීන් පැවති බව ද පසු කාලීනව ඒවා විනාශ වන්නට ඇති බව ද ඇතැමෙකුගේ අදහස වේ. (කිරිබමුණේ, 2005) නමුත් **සී. එච්. පිලිප්ස්** තර්ක ඉදිරිපත් කරමින් ප්‍රකාශ කරන්නේ වෙනත් කෘතීන් ආරක්ෂා වී ඉතිහාස කෘති පමණක් එලෙස විනාශ වීමට ඇති ඉඩ ප්‍රස්ථාව අවම වන බවයි. (Philips, 1961) පුරාණ ග්‍රන්ථවල රජවරුන්ගේ සවිස්තර වංශාවලි සඳහන් වන අතර මහාභාරතය, රඝුවංසය ආදී මහා කාව්‍යයන් වීරකාව්‍ය ලෙස සැළකේ. මෙම පුරාණයන්හි ලක්ෂණ වංසකතා තුළ දක්නට ලැබේ. මහාවංසය, දීපවංසය, හත්ථවනගල්ල විහාර වංසය ආදී වංසකතාවල රාජ චරිත අතිශයෝක්තියෙන් සවිස්තර ලෙස දක්වා තිබේ. නමුත් රාජ චරිත ඉස්මතු කරලීම පමණක් ම වංසකතාවල දක්නට නොහැකිය. ඉන් එහාට ගිය පුවත් විස්තර කිරීමක් ද ඒවායෙහි දක්නට ලැබේ. ඒ අනුව සංස්කෘත සාහිත්‍ය තුළ දක්නට ලැබුණු පුරාණයන්ගේ ලක්ෂණයන්ට සමානව ඓතිහාසික තොරතුරු සම්පාදනය ආරම්භ වූ බවට ඉදිරිපත් වන මතය එතරම් සාර්ථක එකක් නොවන බව පැහැදිලිය. පුරාණවලට වඩා අර්ථවත් වූත් ක්‍රමික වූත් ශාසනික, ආගමික හා ඓතිහාසික වූ ප්‍රවෘත්ති වංසකතා තුළින් උකහාගත හැකි බව හඳුනාගත හැකිය.

ශ්‍රී ලාංකේය වංසකතා සඳහා ආදර්ශයට ගත හැකි ඉන්දියානු කෘතියක් එරට නොවූ බව පැහැදිලිය. ශ්‍රී ලාංකේය ඉතිහාස කෘතීන් සමඟ සැසදිය හැකි එකම ඉතිහාස ග්‍රන්ථය වන රාජතරංගණිය පවා රචනා වී තිබෙන්නේ දීපවංසය, මහාවංසය රචනා කිරීමෙන් බොහෝ කලකට පසුවය. ඇතැම් ඉන්දියානු ප්‍රදේශ අලලා ප්‍රාදේශීය ඉතිහාසකරණ සම්ප්‍රදායක් තිබුණු බවට සාධක හමු වුවද ඒවා ද ලංකාවේ වංසකතාවලට වඩා පසු කලෙකදී රචනාකොට ඇති බව දක්නට ලැබේ. කෙසේ වුවද මෙරට අනෙක් සෑම අවස්ථාවකදී ම මෙන් ඉතිහාසකරණ සම්ප්‍රදාය කෙරෙහි ද ඉන්දීය ආභාෂය ලැබී ඇති බවට කරුණු අධ්‍යයනයේදී හඳුනාගත හැකිය. මෙරට මුල්කාලීන ඉතිහාසය, බුදු දහමේ ඉතිහාසය සළකන විට දීපවංසය, මහාවංසය ආදියෙන් ඉන්දියානු සම්බන්ධය හඳුනාගත හැකිය. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම පිළිබඳ වංසකතාගත තොරතුරු අනුව ත්‍රිපිටකය හා අට්ඨකතා ඉන්දියාවේ සිට මිහිඳු හිමි ඇතුළු පිරිස වාචික ස්වරූපයෙන් මෙරටට රැගෙන පැමිණෙන්නට ඇති බව පැහැදිලිය. ඒවා ගුරු කොටගනිමින් මෙරට ඉතිහාසකරණයන්හි ආරම්භය සිදු වන්නට ඇති බව උගතුන් පෙන්වා දෙයි. (කිරිබමුණේ, 2005) ඉන්දියානු බෞද්ධ සාහිත්‍ය විමසන විට බුද්ධ පරිනිර්වාණයෙන් පසු නිකාය භේදය නිසාවෙන් මුල් බුද්ධ දේශනාවල නිරවද්‍යතාව සනාථ කිරීමට මෙන්ම වෙනත් නිකායිකයන් කරුණු සැක කිරීමට ඉඩ ඇති නිසා ඉන්දියානු බුදු සමයේ ඉතිහාසයට අදාල කරුණුවල ඓතිහාසිකත්වය වඩාත් ඉස්මතු වන ආකාරයෙන් රාජ්‍ය සමයන් හා සම්බන්ධ කොට

සංග්‍රහ කර තිබෙනු දැකිය හැකිය. මේ ආභාෂයෙන්ම මෙරට බොහෝ වංසකතාවන් ද ප්‍රධාන රජ පවුල හා සම්බන්ධ කොට තොරතුරු ඉදිරිපත් කර තිබේ. එමෙන්ම මෙරට ප්‍රධානතම වංසකතා ද්විත්වය වන දීපවංසය හා මහාවංසය කරුණු ඉදිරිපත් කිරීමේදී ඉන්දියානු සම්ප්‍රදාය අනුව යමින් බුදු රජාණන් වහන්සේගේ සමයේ සිට ම මගධ රාජවංශයේ රජුන් හා සම්බන්ධ කොට බුදු සමයේ ඉතිහාසය විස්තර කරන අතර අශෝක රාජ සමය තෙක් විස්තර කර තිබේ. එමෙන්ම බුදු රජුණ්ගේ පරිනිර්වාණ දිනය හා සම්බන්ධ කරමින් විජයගේ පැමිණීමේ සිට දේවානම්පියතිස්ස සමය දක්වා විස්තර කරන අතර මෙරටට බුදු දහම හඳුන්වා දීමේ පුවතින් අශෝක සමය හා දේවානම්පියතිස්ස සමය සම්බන්ධ කොට ඉන් ඉදිරියට ලංකාවේ බුදු සමයේ ඉතිහාසය විස්තර කර තිබේ.

ඓතිහාසික තොරතුරු සම්පාදනය සඳහා බලපෑ හේතූන් බුද්ධ කාලයේදී ම ලැබුණේ යැයි ඇතැම් විද්වතුන්ගේ අදහස වෙයි. **සී. එච්. පිලිප්ස්** ආදීන් පෙන්වා දෙන්නේ බෞද්ධ ග්‍රන්ථ තුළ ඉතිහාසය පිළිබඳ වඩාත් තීව්‍ර ප්‍රබල හැඟීමක් පවතින බවයි. (Philips, 1961) මෙලෙසින් ප්‍රභවය වූ ඓතිහාසික තොරතුරු සම්පාදනය සියවස් ගණනාවක් පුරා ව්‍යාප්ත වෙමින් පවත්වාගෙන යන ලදී. පාලිවංස සාහිත්‍යය විශාල වූත් පරිපූර්ණ වූත් සාහිත්‍යයාංගයක් වන අතර එහි ආදීම කෘති වශයෙන් සැලකිය හැකි වන්නේ බුද්ධවංසයයි. ඇතැමෙක් මහින්දාගමනයට පෙර ලංකාවේ සිදු වූ ඓතිහාසික තොරතුරු ජනතාව මතකයෙන් පවත්වාගෙන එන්නට ඇතැයි තර්ක ඉදිරිපත් කරයි. නමුත් එය හුදු කරුණු දැක්වීමක් පමණක් බව පෙනේ. එවැන්නක් සිදු වුවද එය සංවිධිත ක්‍රියාවලියක් නොවන්නට ඇත. එවැනි තොරතුරු එකතුවක් පැවතියේ නම් ලංකා ඉතිහාසයේ ප්‍රාග් ඓතිහාසික අවධිය අභව්‍ය සිදුවීම්වලින් සමන්විත විය නොහැකිය. මහාවංසයේ ප්‍රාග් ඉතිහාසය වෙනුවෙන් යොදවා ඇති පරිච්ඡේද හත තුළ ඇතුළත් තොරතුරු මහාවංසයේ විශ්වාසනීයත්වයෙන් අඩුම කොටස ලෙස කීම සාවද්‍ය වන්නක් නොවේ.

ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය කෘතියේ, ලංකා ඉතිහාසයේ මූලාශ්‍ර පිළිබඳව කරුණු දක්වමින් **ලක්ෂ්මන් එස්. පෙරේරා** ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු සම්පාදනයේ ආරම්භය පිළිබඳ මෙලෙස අදහස් ඉදිරිපත් කර තිබේ. "ඉතිහාසය ලියා තැබීම පිළිබඳ මේ පරම්පරාවේ මුල නම් බුද්ධ ධර්මය ඉන්දියාවේ පහළ වීමය. මහාවංසයත්, දීපවංසයත් වර්තමාන යුගය දක්වා ම නොකඩවා ලියනු ලැබීමෙන් පෙනෙන්නේ මේ පරම්පරාව මේ යුගය දක්වා ම පවත්නා බවය. මෙය වනාහි භික්ෂූන් වහන්සේලා විසින් ම කරන ලද කර්තව්‍යයකි. මේ ඉතිහාස පරම්පරාවන් අපට ලැබුණේ ද ඒවා විහාරවල පොත්ගුල්වල තබා ආරක්ෂා කරගනු ලැබූ නිසාවෙනි. මෙලෙස ශ්‍රී ලංකාවේ ඉතිහාස සම්ප්‍රදායට විවිධ ආදර්ශයන් ලැබුණ ද රීතිය හා අරමුණ අතින් ලංකාවේ ඓතිහාසික සම්ප්‍රදාය බුදු දහමේ බලපෑම යටතේ වෙනම මගක් ගෙන තිබෙන බව පැහැදිලිය." (පෙරේරා, 1964)

එමෙන්ම **සිරිමා කිරිබමුණේ** මෙලෙස සඳහන් කර තිබේ. "මහාවංසය වැනි වංසකතාවලට පදනම් වූ ඓතිහාසික සාහිත්‍යය දියුණු වූයේ බෞද්ධ ආරාම තුළය. ඒවා ලියන ලද්දේ බෞද්ධ භික්ෂූන් විසිනි. ලංකාවේ ඓතිහාසික සම්ප්‍රදායේ පරිණාමය හදාළ යුතු වන්නේ භාරතය හා පැවති සම්බන්ධතා බෞද්ධ සාහිත්‍යය සමඟ වූ සමීප සම්බන්ධය හා ලංකාවට බෞද්ධ ධර්මය ගෙන ඒමට තුඩුදුන් කරුණු යන මේ සියල්ල පසුබිම් කොටගෙනය." (කිරිබමුණේ, 2005)



ඡායාරූපය 02 - මුල්ම ඓතිහාසික තොරතුරු සම්පාදනයන්

**ආර්. ඒ. එල්. එච්. ගුණවර්ධනයන්ගේ** අදහස වන්නේ විහාරාරාම කේන්ද්‍ර කරගෙන බිහි වූ ඓතිහාසික තොරතුරු සම්පාදනය මෑතක් වනතුරුම විහාරාරාම ආශ්‍රිතව පැවති බවයි. බුදුදහම හඳුන්වාදීමත් ඒ හා සම්බන්ධ සිදුවීම් මාලාව පිළිබඳව ඉතිහාසයත් වඩ වඩාත් පුළුල් වී යත්ම එය ත්‍රිපිටක අටුවාවන්ගෙන් වෙන් කර වෙනම සංග්‍රහ කර පවත්වාගෙන යාම සඳහා මහා විහාරයේ භික්ෂූන් උත්සාහ දරන්ට ඇතැයි සිතිය හැකිය. මහාවංසය සඳහා මූලාශ්‍ර කරගන්නා ලදැයි වංසත්ථප්පකාසිනියේ සඳහන් සීහලට්ඨකථා මහාවංස, සීහලට්ඨකථා, (Vamsatthapakasini, 1935) පොරාණට්ඨකථා (Vamsatthapakasini, 1935) එම උත්සාහයේ ප්‍රතිඵලයක් විය හැකිය. මහාවංසය ආරම්භයේදී ම තමාට පාදක වූ මූලාශ්‍ර සඳහන් කර තිබේ. මෙහිදී ‘‘පොරාණෙහි කතො පෙසො’’ (මහාවංසය, 2018, 1 පරි. 2 ගාථාව) යනුවෙන් ‘‘පැරැන්නන් විසින් කරන ලද්ද’’ යනුවෙන් කරන ලද සඳහන් පිළිබඳ විමර්ශනය කිරීම ඉතා වැදගත් ය. එම සඳහනින් මහාවංසයට පෙර පැහැදිලිව ම ඉතිහාස තොරතුරු එකතුවක් පැවති බව ගම්‍ය වෙයි. මෙහි ‘‘පොරණ’’ යන්නෙහි වචනාර්ථය විමසා බැලීමේදී පැරැන්නා, පුරාණ වූ, පෙර සිටි හෝ පෙර සිදු වූ යන අර්ථය ඉන් ඉස්මතු වේ. ඒ අනුව ‘‘පැරැන්නන් විසින්’’ යන අර්ථය ලබා දෙයි. මහාවංස කතුවරයා ප්‍රකාශ කරන්නේ තමා මෙම කෘතියෙහි සංශෝධනයක් සඳහා යොමු වන බවයි. (මහාවංසය, 2018, 1 පරි. 3 ගාථාව) එහි සඳහන් කරන ‘‘පොරාණෙහි’’ යන්න විවරණය කරන වංසත්ථප්පකාසිනී කතුවරයා එයින් අදහස් කළේ සීහළට්ඨකථා මහාවංසය ම බව අවධාරණය කර තිබේ. සිංහල බසින් පැවති සීහළට්ඨකථාව හෙළබස අතහැර මාගධී භාෂාවට නැඟීම මහාවංසයේ අභිප්‍රාය වූ බව ඉන් කියැවේ.

**ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු සම්පාදනයේ මුල් ම අවස්ථා**

- **සීහලට්ඨකතා මහාවංසය**

මහාවංස කතුවරයා ග්‍රන්ථාරම්භයේදී ම තමා පැරණි කෘතියක සංශෝධනයක් සිදු කරන බව පෙන්වා දී තිබේ. (Vamsatthapakasini, 1935) මහාවංසය සඳහන් කරන එම පැරණි කෘතිය මහා විහාරිකයන් සිංහල බසින් රචිත මහාවංසය බව වංසත්ථප්පකාසිනිය ඍජුව ම සඳහන් කරයි. (රතනසාර හිමි, 2017) එසේ නම් සීහලට්ඨකථා මහාවංසයේ ස්වරූපය කෙබඳු ද යන්න විමර්ශනය කළ යුතුය. මෙය ශේෂව නොපැවතිය ද වංසත්තප්පකාසිනිය ඇසුරු කරගෙන මෙම කෘතිය සම්බන්ධයෙන් යම් තොරතුරු ප්‍රමාණයක් හෙළි කර ගැනීමට හැකිය. පැරණි මහාවංසය පිළිබඳ "සීහළට්ඨකථා මහාවංසය", "සීහළට්ඨකථාව", " අට්ටකථාව" හා "පොරාණට්ඨකථා" යන නාමයන්ගෙන් වංසත්තප්පකාසිනිය සඳහන් කර ඇත. (Vamsatthapakasini, 1935) මෙය මහාවිහාරීය ඓතිහාසික තොරතුරු සම්පාදනයේ මූලික ම අවස්ථාවන් විද්‍යමාන කරන බව හඳුනාගත හැකි අතර පවතින සාධක

සැලකිල්ලට ගත්විට මෙය ගද්‍යයෙන් කරන ලද්දකැයි නිගමනය කළ හැකිය. අට්ඨකතා යන නම යොදා තිබීමත් පාලි මහාවංසය, ''පජ්ජපද මහාවංසය'' යනුවෙන් පද්‍යයෙන් කළ එකක් බව විශේෂ කර දැක්වීමෙනුත් මුල් කෘතිය ගද්‍යයෙන් පැවති බව සිතීමට යොමු කරයි. මෙම සිංහල ගද්‍ය මහාවංසය සංස්කරණයට තමන් යොමු කළේ එහි පැවති ත්‍රිවිධ දෝෂයන් නිසා බව මහාවංස කතුවරයා සඳහන් කරයි. ඒ නිසා මහාවංසය නව තොරතුරුවල එකතුවක් ලෙස සැළකීමට වඩා පැරණි සිංහල ගද්‍ය මහාවංසයේ සංස්කරණයක් යැයි සැලකීම යෝග්‍ය වේ. මුල් කෘතියේ විස්තර අඩු නොකර දෝෂ පමණක් ඉවත් කර මහාවංසය ලියූ බව සඳහන් කිරීමෙන් එය එසේ වූ බව වංසත්තප්පකාසිනිය ද තහවුරු කරයි. (රතනසාර හිමි, 2017) මෙය ලිඛිත කෘතියක් ලෙස සැලකිය නොහැකි බැවින් එය මුඛ පරම්පරාගතව පවත්වාගෙන පැමිණි බව පෙනේ.

ත්‍රිපිටකය උදෙසා සිංහල බසින් විවරණ සැපයූ සිංහල මහාට්ඨකතාවේ පෙරවදනක් ලෙස සීහළට්ඨකථා මහාවංසය පවතින්නට ඇත. පසු කලෙක ඓතිහාසික තොරතුරු ප්‍රමාණය වැඩි වී යාමත් සමඟ ම එය මහාට්ඨකථාවෙන් වෙන් වූ කෘතියක් වූ බව ගයිගර් මහතාගේ අදහස වේ. (Geiger, 1908) මුලින් ම මහට්ඨකතාව හා බැඳී පැවැති පෙරවදනට ඇතුළත්ව පැවතියේ මිහිඳු හිමියන්ගේ කාලය දක්වා තොරතුරු පමණක් වන්නට ඇති බව ගයිගර් මහතා තවදුරටත් දක්වා ඇත. (Geiger, 1908) මහාට්ඨකතාවෙන් වෙන් වූ පසු එය පසුකාලීන තොරතුරු එකතු කරමින් ගද්‍ය ස්වරූපයෙන් සිංහල බසින් පවත්වා ගෙන එන්නට ඇත. දුටුගැමුණු පුවත පිළිබඳ සවිස්තර වාර්තාවක් මහාවංසයේ ඇති බැවින් එතෙක් විස්තරාත්මකව සීහළට්ඨකථා මහාවංසය කරුණු දක්වා තිබෙන්නට ඇති බව සිතිය හැකිය. එසේ වුවද වළගම්බා රජුගෙන් පසු ඉතිහාසය අධ්‍යයනයේ දී මහාවංසයේ සඳහන් තොරතුරුවල සත්‍යභාවය පිළිබඳ ගැටලු ඇති වේ. එමෙන්ම විස්තරාත්මක බවින් ද අල්පය. දුටුගැමුණුගේ සිට මහසෙන් දක්වා දීර්ඝ රාජ්‍ය සමයට මහාවංසයේ වැයකොට ඇත්තේ පරිච්ඡේද පහක් පමණි. සංඝබෝධි රජු පිළිබඳව මහාවංස විස්තරය මෙතෙක් මහාවංසයේ පැවති විශ්වාසනීය ස්වරූපය වෙනස් වෙමින් කාල්පනික වූ ජන කතාවක ස්වරූපය ගනී. මෙම අවධියේ සමහර සිදුවීම් පිළිබඳ සඳහන් කිරීමක් හෝ සිදු වී නැත. එසේ වන්නට ඇත්තේ මහාවංසය මූලාශ්‍ර කරගත් සිංහල අට්ඨකථාව මෙම යුගය පිළිබඳ තොරතුරු අල්ප ලෙස වාර්තා කළ බැවින් විය යුතුය. ඇතැම්විට එය මහාවංස කතුවරයා විසින් අනවශ්‍ය යැයි මෙම තොරතුරු නොසලකා හැරියේ යැයි නිගමනයකට එළඹිය ද මහාවංසය විවරණය කරන වංසත්ථප්පකාසිනිය, සීහළට්ඨකථා මහාවංසයෙන් තොරතුරු ගෙනහැර දක්වන්නේ එකම අවස්ථාවක පමණි. වංසත්ථප්පකාසිනිය එකම අවස්ථාවකදී පමණක් සීහළට්ඨකථාව උපයුක්ත කරගත් බවක් ඉන් නොකියවුන ද ඊට පෙර අවධියේ මෙන් එහි වැඩි විස්තර නොතිබීම අඩු වශයෙන් යොදාගන්නට හේතු වූ බව පැහැදිලි වේ.



**ඡායාරූපය 03 - ඓතිහාසික තොරතුරු සම්පාදනයට යොදාගත් පුස්කොළ පොත්**

සීහළට්ඨකථාවේ මෑතකාලීන ඉතිහාසය විචාරාත්මක නොවීමත් කරුණු ගිලිහීයාම සහ තොරතුරු ඇතුළත් වීමට බලපෑ හේතු විමසා බැලිය යුතුය. සීහළට්ඨකථාවේ මුල්

කොටස ත්‍රිපිටකය සමඟ ලේඛනගත කරන්නට ඇති බවත් පසු කොටස් පසු කාලීනව ලියැවෙන්නට ඇති බව ගයිගර් මහතාගේ අදහස වේ. (Geiger, 1908) මේ වන විට දුටුගැමුණු සමය දක්වා වූ ඓතිහාසික තොරතුරු සම්පාදනය වී තිබෙන්නට ඇත. සීහළට්ඨකථාවේ මෑතකාලීන ඓතිහාසික තොරතුරු දුර්වල ලෙස සම්පාදනය වීමට මහසෙන් රජුගේ ක්‍රියාකලාපය ප්‍රබල සාධකයක් වන්නට ඇත. මහාවිහාරය විනාශ වීමේ දී පැරණි සීහළට්ඨකථාවේ වාර්තා ද විනාශ වන්නට ඇත. එම වාර්තා සපයාගත නොහැකි වූ පසු කාලීන භික්ෂූන් වහන්සේලා එම තොරතුරු පූර්ණය කිරීමේ දී මෙවැනි දුර්වලතා සහිතව එය ඉටු කරන්නට ඇත. මහසෙන් සමයේ මහාවිහාරය මුහුණ දුන් අභියෝග හමුවේ සීහළට්ඨකථා මහාවංසයේ ඓතිහාසික තොරතුරු සම්පාදනය තාවකාලිකව ඇණහිටි බවක් හඳුනාගත හැකිය.

- **පොරාණ**

දැනට ශේෂ වී නොපවතින මුල්කාලීන ඓතිහාසික තොරතුරු සම්පාදනයේ අවස්ථාවක් ලෙසින් "පොරාණ" හඳුනාගත හැකිය. පොරාණ යනුවෙන් වංසත්ථප්පකාසිනීයේ අවස්ථා 7 කදී සඳහන් වේ. ත්‍රිපිටකානුබද්ද පාලි අට්ඨකථාවල ද පොරාණ යනුවෙන් සඳහන් වී තිබේ. වංසත්ථප්පකාසිනිය දක්වන පොරාණ යනු අට්ඨකතාවක් බවට **ඕල්ඩන්බර්ග්** මහතා සඳහන් කරයි. (Oldernberg, 1879) අදිකාරම් මහතා පවසන්නේ ද අට්ඨකතාවක් බවයි. (අදිකාරම්, 1963) වංසත්ථප්පකාසිනිය පද්‍ය නවයක් සහ ගද්‍යමය ඡේද දෙකක් ද පොරාණයන්ගෙන් උපුටා දක්වයි. මෙම පොරාණයන්ගේ එන පද්‍යයන් වෙනස්කම් සහිතව දීපවංසයේ ද විද්‍යාමාන වෙයි. පොරාණ පිළිබඳව උගතුන්ගේ අවධානය යොමුව තිබුණ ද පුළුල් අධ්‍යයනයක් කිරීමට ප්‍රමාණවත් තරම් සාධක හමු වී ඇති බවක් දැකිය නොහැකිය. මුල්ම ඓතිහාසික තොරතුරු සම්පාදනය අවස්ථාවක් මෙමගින් නියෝජනය වූ බව සඳහන් කළ හැකිය.

- **උත්තරවිහාරට්ඨකථා**

මහාවිහාරය ස්වකීය ආරාම සම්ප්‍රදායේ ඉතිහාස කතාව ''සීහළට්ඨකථා මහාවංසය'' ඔස්සේ පවත්වාගෙන ගිය ආකාරයට ම අභයගිරි නිකායිකයන් ද තම ඉතිහාස කතාව පවත්වාගෙන ගොස් තිබෙන අතර මෙම අභයගිරි ඉතිහාස කතාව වර්තමානයේ ශේෂව නොමැත. මුල් ම ඓතිහාසික තොරතුරු සම්පාදනය පිළිබඳ ව්‍යාපෘති සම්බන්ධයෙන් මෙන් ම අභයගිරි ඉතිහාස කතාව පිළිබඳව ද තොරතුරු දැක්විය හැක්කේ වංසත්ථප්පකාසිනිය ඇසුරිනි. "උත්තරවිහාරට්ඨකථා", "උත්තරවිහාර මහාවංසය" සහ " උත්තර මහාවිහාරවාසීන්ගේ අට්ඨකථාව" ආදී නාමයන්ගෙන් එම ඓතිහාසික තොරතුරු සම්පාදනය වංසත්ථප්පකාසිනියේ සඳහන් වේ. සීහළට්ඨකථා මහාවංසයට වඩා ඇතැම් තැනෙක විස්තර සහිත ඉතිහාසයක් ඉන් කියවුණු බව සිතීමට සාධක වංසත්ථප්පකාසිනියෙන් සපයාගත හැකිය. මහාසම්මත රාජවංශය පිළිබඳ උපුටා ගැනීම් 2 ක්, මගධ රාජවංශය පිළිබඳ උපුටා ගැනීම් 3 ක් සහ විජය-පණ්ඩුකාභය සමය පිළිබඳව ද මහාවංසයේ නැති තොරතුරු උත්තර විහාරට්ඨකථාවෙන් වංසත්ථප්පකාසිනියේදී ගෙනහැර දැක්වෙයි. උත්තරවිහාරට්ඨකථාවෙන් බුද්ධාගම පිහිටුවීම දක්වා හෝ ඉතිහාස කතා විස්තර කරන්නට ඇතැයි සිරිමා කිරිබමුණේ මහත්මිය පෙන්වා දෙයි. (කිරිබමුණේ, 2005)

වංසත්ථප්පකාසිනිය බොහෝ විට උත්තර විහාරට්ඨකථාවෙන් කරුණු දක්වන්නේ කෘති දෙකෙහි වෙනස්කම් ඇති අවස්ථාවලදීය. ඒවා ද දීර්ඝව විස්තර නොකරන අතර උත්තර විහාරට්ඨකථාව බැලීමට ලබාදෙන උපදේශයන් බව හඳුනාගත හැකිය. සම්ප්‍රදායන් දෙකේ වෙනසක් නොවූ අවස්ථාවල මහාවංසයේ පරිදි ම කරුණු විස්තර කර ඇත. මෙම වංසකතාව ද සීහළට්ඨකථා මහාවංසය මෙන්ම එක්වර නොලියන ලද එම නිකායික භික්ෂූන්ගේ සංස්කරණයක් විය යුතු බව බොහෝ දෙනකුගේ පිළිගැනීම වේ. (ගමගේ, 2019) වංසත්ථප්පකාසිනී කතුවරයා අතට එය පත් වී ඇති බැවින් එය ක්‍රි. ව. 10 වන සියවස පමණ කාලයේ දී ජනප්‍රිය කෘතියක් වූ බවට සිතිය හැකිය.

**ආරාම මගින් සිදුකර ඇති අප්‍රකට ඓතිහාසික තොරතුරු සම්පාදනයන්**

මෙරට බුදු දහම වර්ධනය වීමේදී ථේරවාදී හා මහායාන සම්ප්‍රදායන් එකිනෙකා අභිබවමින් කටයුතු කළ බව පැහැදිලිය. මෙහිදී ඒ ඒ සම්ප්‍රදායිකයන් අනෙක් සම්ප්‍රදායන්ට අභියෝගයක් වෙමින් කටයුතු කළ ආකාරය මහාවිහාරය, අභයගිරිය හා ජේතවනාරාමය විහාරයන්හි වාසය කළ භික්ෂූණ් වහන්සේලාගේ කටයුතු විමසන විට පැහැදිලි වේ. මුල්කාලීනව මහාවිහාර පාර්ශවය පමණක් හඳුනාගත හැකි වූ අතර වළගම්බා රාජ්‍ය සමයේදී සිදුවන බේදී යාමේ දී මහාවිහාරයේ සිටි භික්ෂූණ් පිරිසක් ම ඉන් ඉවත්ව අභයගිරියට යෑම සැළකිල්ලට ගත් විට ඔවුන් මහාවිහාරයේදී ප්‍රගුණ කළ ඉතිහාසකරණ දැනුම ද සමගින් මෙලෙස අභයගිරියට ගිය බව පැහැදිලිය. ඒ අනුව ඔවුන් එහිදී ද ඉතිහාසකරණයන් සිදු කරන්නට ඇත. අනෙක් අතට මහාවිහාරයට වඩා අභයගිරිකයන් නිතරම ප්‍රගතිශීලී පිරිසක් වීම නිසාවෙන් මහාවිහාරයට අභියෝගයක් ලෙස තම ඉතිහාස රචනයන් සිදු කරන්නට උත්සාහ කරන්නට ඇත. එමෙන්ම පසුකාලීනව ඉදිරියට පැමිණෙන ජේතවන විහාරිකයන් ද ඉතිහාසකරණයන්හි නිසැකවම නිරත වන්නට ඇත. මෙම තත්ත්වය මහාවංසයේ ටීකාව වූ වංසත්ථප්පකාසිනී කතුවරයා තම සම්ප්‍රදායට පටහැනි අභයගිරිකයන්ගේ උත්තර විහාරට්ඨකතා මහාවංසය භාවිතා කිරීම විමසීමෙන් පැහැදිලි වේ. ෆාහියන් හිමියන්ගේ ගමන් විස්තරය විමසන විට උන්වහන්සේ මෙරටට පැමිණි සමයේ අභයගිරියේ භික්ෂූණ් 5000 ක් පමණ ද මහා විහාරයේ 3000 ක් පමණ ද ජේතවනාරාමයේ 2000 ක් පමණ ද වාසය කළ බව පෙනේ. (බලගල්ලේ, 1958) මෙයින් ඒ ඒ විහාරයන්හි පැවති තත්ත්වය පැහැදිලි කරගත හැකිය.

මහාවිහාරය, අභයගිරිය මෙන් ම වෙනත් විහාරයන් මගින් ස්වකීය ආරාමීය ඓතිහාසික තොරතුරු එකතුවක් පවත්වාගෙන යන්නට ඇති බව සිරිමා කිරිබමුණේ පවසයි. (කිරිබමුණේ, 2005) නමුත් ඒ පිළිබඳ සාධක දෘශ්‍යමාන නොවේ. ඒ ඒ විහාරයන් ස්වකීය ඉතිහාසය පවත්වාගෙන ගියා පමණක් නොව බුදු සසුන හා බැඳි පූජා වස්තුවල ඉතිහාසය පවත්වාගෙන යාමට ද ආරාම මගින් සැලසුම් කර තිබේ. ඒ අනුව ශ්‍රී මහා බෝධිය, රුවන්වැලිසෑය ආදී පූජා වස්තූන්ගේ ඉතිහාස කතාවන් පවත්වාගෙන ගොස් ඇති බව හඳුනාගත හැකිය. ශ්‍රී මහා බෝධි ආගමන කතාව දක්වන ලද වංසත්ථප්පකාසිනිය ඒ පිළිබඳ වැඩිදුරට තොරතුරු බෝධිවංසට්ඨකථාවේ ඇතැයි සඳහන් කර තිබේ. මෙහි දක්වන බෝධිවංසට්ඨකථාව දැනට පවතින පාලි බෝධිවංසය බව ගයිගර් මහතා දක්වන අතර (Geiger, 1908) එහි සඳහන් භාෂා ලක්ෂණ හා අන්තර්ගත කරුණු ඇසුරෙන් පාලි බෝධිවංසය මෑත යුගයේදී රචිත එකක් බව පෙනීයයි. එනිසා මෙහි සඳහන් බෝධිවංසට්ඨකථාව ශේෂ වී පවතින්නක් විය නොහැකිය. (රතනසාර හිමි, 2017)

මහාථූපය හෙවත් රුවන්වැලිසෑයෙහි ඉතිහාසය දැක්වීමට ලියූ කෘතියක් ලෙස චේතියවංසට්ඨකථාව හඳුනාගත හැකිය. වංසත්ථප්පකාසිනිය මෙම කෘතිය "චේතියවංසට්ඨකථා", " මහාචේතියවංසට්ඨකථා" යන නම්වලින් හඳුන්වා ඇත. එසේම ක්‍රි. ව. 10 වන සියවසෙන් පසුව ලියවුණු පාලි ථූපවංසය ද තමාට පෙර සිංහල භාෂාවෙන් හා පාලි භාෂාවෙන් පැවති කෘතීන් පිළිබඳ සඳහන් කර තිබේ. මීට අමතරව දැනට විද්‍යමාන නොවන කෘති රාශියක් පිළිබඳ වංසත්ථප්පකාසිනිය ඔස්සේ කරුණු විමසිය හැකිය. **සහස්සවත්ථු අට්ඨකථාව, දීපවංසට්ඨකථාව, චූලසීහනාද සූත්‍ර වර්ණා සිංහල අටුවාව, ගණ්ඨිපදත්ථවර්ණනාව** සහ **සීමාකථාව** වැනි කෘතීන් ඒ අතර වෙයි. (Vamsatthapakasini, 1935) මේවායින් විවිධ තොරතුරු වංසත්ථප්පකාසිනිය උපුටා දක්වන බැවින් මෙම කෘතීන් ශ්‍රී ලංකාවේ මුල්ම ඓතිහාසික සම්පාදන අවස්ථාවන් නියෝජනය කළ බව සිතය හැකිය. (රතනසාර හිමි, 2017)



ඡායාරූපය 04 - පුස්කොළ රචනා කිරීමට භාවිතා කළ පන්හිද

**ඉතිහාසකරණ සම්ප්‍රදායේ වර්ධනය**

මෙරට ඉතිහාසකරණ සම්ප්‍රදායේ වර්ධනය දෙස අවධානය යොමු කරන විට ප්‍රධාන අවස්ථාවන් කීපයක් හඳුනාගත හැකි වේ. එහිදී දීපවංසය, මහාවංසය, සමන්තපාසාදිකාව හෙවත් විනයට්ඨ කථාව, මහාවංසයේ පසු කොටස්, මහාවංසටීකාව හෙවත් වංසත්තපප්කාසිනිය, හත්ථවනගල්ල විහාරවංසය, සීහළවත්ථුපකරණය, සහස්සවත්ථුපකරණය, රසවාහිනිය, රාජාවලිය, මහාචේතිය වංසට්ඨකතාව, මහාබෝධි වංසට්ඨකතාව, මහාබෝධිවංසය, ථූපවංසය, ලලාට ධාතුවංසය, දාඨාවංසය, දළදා සිරිත, දළදා පූජාවලිය, කේශධාතුවංසය, පූජාවලිය, සද්ධම්ම සංග්‍රහය, නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතරණය, සද්ධර්මරත්නාකරය, සද්ධර්මරත්නාවලිය ආදී අවස්ථාවන් ඉතා වැදගත් වේ. මෙම මූලාශ්‍රයන් මෙරට ඓතිහාසික සම්ප්‍රදායේ වැදගත් අවස්ථාවක් පිළිබිඹු කරන අතර මෙරට ඉතිහාසය පිළිබඳ හැදෑරීමේදී වැදගත් තොරතුරු සමුදායක් හෙළිදරව් වන බව පැහැදිලි වේ. මෙම මූලාශ්‍රයන් ආගමික පක්ෂය නියෝජනය කරන බැවින් අතිශයෝක්තිගත තොරතුරු රාශියක් අන්තර්ගත වුවද එම අතිශයෝක්තීන් ඉවත් කොට මෙරට ඉතිහාසය සකස් කර ගැනීමට වැදගත් වන තොරතුරු රාශියක් රැස්කරගත හැකි බව මනාව පැහැදිලි වේ. මෙරට ඓතිහාසික සම්ප්‍රදායේ වර්ධනය දෙස බලන විට වංසකතා සහ ඓතිහාසික ග්‍රන්ථ රචනා කිරීමේ සම්ප්‍රදායක් හොඳින් වර්ධනය වී තිබෙන බව මෙයින් පැහැදිලි වේ. විවිධ අරමුණු මූලික කරගෙන රචනා වී තිබුණ ද මෙම බොහෝ කෘතිවලින් සැළකිය යුතු ඓතිහාසික තොරතුරු විශාල ප්‍රමාණයක් ඉදිරිපත් වන බව හඳුනාගත හැකිය.

මෙරට ඓතිහාසික සම්ප්‍රදායෙහි වර්ධනය දෙස බලන විට ඒ තුළ හඳුනාගත හැකි ලක්ෂණ කීපයක් වෙයි. මෙරට පුරාතන අවධියේ ඉතිහාසය ගොඩනැංවීම සඳහා කෙනෙකුට නිසැක වශයෙන්ම භාවිතා කිරීමට සිදුවන බොහෝ පැරණි ග්‍රන්ථයන්හි, නූතන කෘතීන්හි දී මෙන් හැඳින්වීම, පෙරවදන හෝ නිගමනය වැනි අංග එහි කතුවරු කිසිවෙකු හෝ ඇතුළත් කොට නැති නමුත් බොහෝ අවස්ථාවලදී එම ග්‍රන්ථවල ආමුඛයෙහි හෝ ඒවායෙහි අවසානයෙහි හෝ අදාළ ග්‍රන්ථය රචනා කිරීමට මුල් වූ හේතු

හෝ කතුවරයාගේ මූලික අවධානය යොමුකර ඇති අංග පිළිබඳ කරුණු සඳහන් කර ඇති බව අමතක නොකළ යුතුය. මේ තත්ත්වය වඩා පහසුවෙන් අවබෝධ කොට ගැනීමට මෙරට පැරණිතම වංසකතා දෙක වන දීපවංසය සහ මහාවංසය රචනා කරන ලද කතුවරයන්ගේ අපේක්ෂාව කුමක් වූයේද යන්න විමසා බැලීමෙන් හඳුනාගත හැකිය. (සෝමතිලක, 2020)

- **රචකයින්ගේ පරමාර්ථ**

මෙරට ඉතිහාසකරණ සම්ප්‍රදාය විමසන විට මුල් කාලීනව සිට ම රචකයින්ගේ පරමාර්ථ එකී රචනා කෙරෙහි සෘජුව බලපෑම් කර තිබෙන බව පැහැදිලිය. රචකයාගේ පෞද්ගලික ආකල්ප, අදහස්, මතයන්, ඔවුන් ගුරුකොටගත් සම්ප්‍රදායන් බෙහෙවින් රචනාවන්වලට බලපෑම් සිදුකර තිබේ. මෙය සෑම කෘතියක ම පාහේ දැකිය හැකි ස්වාභාවික ලක්ෂණයකි. මේ සඳහා සෑම කෘතියකින්ම පාහේ නිදසුන් ගත හැකිය. මහාවංසය දෙස බලන විට රචකයා මහාවිහාරීය ථේරවාදී බෞද්ධ භික්ෂුවක් වූ නිසා ඔහුගේ පරමාර්ථය වී තිබෙන්නේ ශාසනික ඉතිහාසය විස්තර කිරීමටත් ථේරවාදයට හා මහාවිහාරයට පක්ෂ ලෙසත් තම රචනාව සිදුකිරීමයි. මේ නිසාවෙන් ඔහුගේ අරමුණුවලට පිටතින් වූ අවස්ථාවන්ට අසාධාරණයන් සිදුවූ අවස්ථා ද පවතී. වළගම්බා, මහසෙන් වැනි පාලකයන්ට මෙලෙස අසාධාරණකම් සිදු වී ඇති බව පැහැදිලිය. තවද හත්තවනගල්ල විහාරවංසය, අත්තනගලු විහාරයේ ඉතිහාසය ඉදිරිපත් කිරීමට ද මහාබෝධිවංසය, ශ්‍රී මහා බෝධියේ ඉතිහාසය රචනා කිරීමටත් ථූපවංසය, රුවන්වැලි සෑය ප්‍රධාන ස්තූප පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට ද ලලාට ධාතුවංසයේ බුදුන්ගේ ලලාට ධාතුව පිළිබඳව ද දළදාවංසය, දළදා සිරිත, දළදා පූජාවලිය ආදී රචනාවන් දළදා වහන්සේගේ ඉතිහාසය හා පූජාවන් පිළිබඳව ද කේශධාතු වංසයේ බුදුන් වහන්සේගේ කේෂ ධාතුව පිළිබඳව ද පූජාවලිය, බුදු රජුන්ට කරන ලද පූජා පිළිබඳව ද නිකාය සංග්‍රහය, ශාසනික ඉතිහාසය ඉදිරිපත් කිරීමට ද ආදී වශයෙන් පරමාර්ථ සහිත රචකයන් විසින් මෙම රචනාවන් සිදුකර තිබෙන බව පැහැදිලිය. නමුත් මේ සෑම කෘතියකින් ම පාහේ මෙරට ඉතිහාසය ගොඩනැගීමට වැදගත් වන ඓතිහාසික තොරතුරු හෙළිදරව් කරගත හැකි බව හඳුනාගත හැකිය.


- **සමකාලීනව පැවති බලපෑම්**

මෙම තත්ත්වය ද සෑම රචකයෙකුට ම පාහේ තම රචනාවන්වල දී බලපාන අයුරු පැහැදිලිය. විශේෂයෙන්ම රචකයා ජීවත් වන අවධියට සමකාලීන අවධියේ දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික, ආගමික වැනි සෑම ක්ෂේත්‍රයක ම පාහේ පවතින තත්ත්වයන්හි බලපෑම් සිදුවන බව හඳුනාගත හැකිය. විශේෂයෙන්ම ඕනෑම සමාජයක ප්‍රමුඛ පෙළේ රචකයන්ට රාජ්‍ය අනුග්‍රහ ලැබීම, සම්මාන හිමිවීම සාමාන්‍ය ලක්ෂණයකි. මොවුන්ට කීර්ති ප්‍රසංසා, ගෞරව සත්කාර හිමිවන නිසාවෙන් තම රචනය තුළ එවැනි නම්බු නාම ලබාදුන් පාලකයන් කෙරෙහි වැඩි වශයෙන් වර්ණනා කිරීමට පෙළඹෙන බව දක්නට ලැබේ. ඇතැම් විට අතිශයෝක්තිගත තොරතුරු පවා අන්තර්ගත කිරීමට පෙළඹේ. තමාට හෝ තම ආචාර්ය පරම්පරාවට උපකාර කළ, සත්කාර කළ අයෙක් වේ නම් ඔහුගේ අඩුපාඩු සඟවමින් ශ්‍රේෂ්ඨත්වය ඉස්මතු කරලීමට උත්සාහ දරනු ලබයි. ආගමික වශයෙන් වුවද රචකයාට සමීප අවස්ථා කෙරෙහි ඔහු වැඩි සැලකිල්ලක් දක්වන බව පැහැදිලිය. මහාවංසය මහාවිහාරයට උපකාර කළ පාලකයන් පිළිබඳ තෘප්තිමත් ආකාරයකින් සඳහන් කර තිබේ. මෙහිදී මහාවිහාරයට බෙහෙවින් උපකාර කළ දුටුගැමුණු රජුට ඉතාමත් වැදගත් ස්ථානයක් ලබා දී තිබේ. එමෙන්ම මහා විහාරයට එරෙහිව කටයුතු කළ නිසා මහසෙන්

රජුට නිසි තැන ලබා දී නැති බවක් හඳුනාගත හැකිය. පූජාවලිය විමසන විට රචකයාට සමකාලීන අවධියේ සිටින්නට ඇතැයි සැලකෙන තුන්වන විජයබාහු හා දෙවන පරාක්‍රමබාහු වැනි පාලකයන් පිළිබඳ දීර්ඝ ලෙස සාකච්ඡා කොට තිබේ. මෙම තත්ත්වය ශ්‍රී ලංකාව තුළ පමණක් නොව ඉන්දියාව, යුරෝපය, චීනය වැනි රටවල ඉතිහාසකරණ තුළ ද ඉතා පැහැදිලිව හඳුනාගත හැකිය.

- **බුදුසමයේ බලපෑම**

විවිධ රටවල ඉතිහාසකරණ සම්ප්‍රදායන් දෙස බලන විට ඒ ඒ රටවල පැවති ආගමික තත්ත්වයන් සෘජුව මෙන්ම වක්‍රව ඒවාට බලපෑම් කර තිබෙන බව හඳුනාගත හැකි තත්වයකි. ශ්‍රී ලංකාව දෙස අවධානය යොමු කරන විට බුදුසමයේ බලපෑම සෘජුවම බොහෝ කෘතිවලට ලැබී තිබෙන බව පැහැදිලිය.



ඡායාරූපය 05 - භික්ෂුවක් විසින් පුස්කොළ පොත් රචනා කරන අවස්ථාවක්

මෙරට සංස්කෘතිය තුළ විශාල වෙනස්කමක් සිදු වන්නේ මහින්දාගමනය හා ඒ ආශ්‍රිත අනෙකුත් සිදුවීම් මගින් මෙරට බුදුදහම ලැබීමත් සමඟය. මේ නිසා බුදු සමයේ බලපෑම්වලින් මිදීමට කිසිදු අංශයකට නොහැකි වූ බව දක්නට ලැබේ. මෙරට ඉතිහාස සම්ප්‍රදායේ ආරම්භය විමසන විට එය සිදුවී තිබෙන්නේ බෞද්ධ ආරාම කේන්ද්‍ර කොටගෙන බව පැහැදිලිය. ඉන් අනතුරුව මෙරට ඓතිහාසික සම්ප්‍රදාය වර්ධනය වීමේ දී බුදුසමයේ බලපෑම නොඅඩුව ලැබී තිබේ. මෙරට ඉතිහාස සම්ප්‍රදායේ වැදගත් අවස්ථාවන් දෙකක් සනිටුහන් කරන දීපවංසය සහ මහාවංසය වැනි කෘතීන් පවා ලියැවී තිබෙන්නේ බුදු සමයේ ඉතිහාසයට අදාල තොරතුරුය. මහාවංසය පිළිබඳව කරුණු දක්වමින් ලක්දිව ඓතිහාසික තොරතුරු සම්පාදනය පිළිබඳ **ලක්ෂ්මන් එස්. පෙරේරා** මහතා වංසකතාවේ සියලුම කර්තෘවරු භක්තිමත් හා ශ්‍රද්ධාවත් භික්ෂූන් බවත් ඔවුන්ගේ ආගමික සංකල්ප ලංකාවේ ඉතිහාසය ලිවීම හා බැඳී පැවතුන බවත් සඳහන් කර තිබේ. (පෙරේරා, 1964)

අනතුරුව මෙරට ඉතිහාසය සම්ප්‍රදායේ වර්ධනයෙහි ප්‍රතිඵල ලෙස විශාල ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා වන අතර ඒ සෑම කෘතියකම පහේ දක්නට ලැබෙනුයේ බුදු සසුනේ බලපෑමයි. ස්තූපය, බෝධීන් වහන්සේ, දළදා වහන්සේ, කේශධාතු වහන්සේ ආදී වශයෙන් පූජා වස්තූන් අරඹයා ඒවායෙහි විවිධ පැතිකඩයන් අදාළව හා විහාරස්ථාන ඇසුරුකොටගෙන නිර්මාණය වන සෑම කෘතියකම පාහේ පැහැදිලිව දක්නට ලැබෙනුයේ බුදුසමයේ බලපෑමයි. මෙරට සංස්කෘතිය දියුණු වීමේ මුල් කාලීන අවධියේ සිට පසු කාලය දක්වා බුදුසමයේ බලපෑම දක්නට ලැබෙන අතර ඒ සඳහා බුදු සමයෙන් ලැබුණු පිටුබලය කිසිවිටෙකත් පසෙක දමා සාකච්ඡා කළ නොහැකිය. මෙකී බුදුසමයේ බලපෑම නිසා බෞද්ධ මුහුණුවරකින් සාකච්ඡා කරන රචනාවන් තුළ මෙරට ඉතිහාසය හැදෑරීමටත් ඉතිහාසය ගොඩනැගීම කෙරෙහිත් කරුණු ඉදිරිපත් වීම ඉතා වැදගත්ය. ඊට අමතරව මෙරට ඉතිහාසකරණය යටතේ බොහෝ රචනාවන් සිදුකර තිබෙන්නේ විදග්ධ බෞද්ධ භික්ෂූන් වහන්සේලා ය. තවද මෙරට ඓතිහාසික සම්ප්‍රදාය වර්ධනය වන මහාවිහාරික

සම්ප්‍රදාය මෙන්ම අනෙකුත් සම්ප්‍රදායන් සියල්ලක්ම ගොඩනැගී ඇත්තේ බුදු සසුණ ඇසුරිනි.

- **පෞද්ගලික අවශ්‍යතා**

රචකයන්ගේ පෞද්ගලික ආශයන් ඔවුන්ගේ රචනයන් සඳහා පැහැදිලි ලෙසම බලපානු ලබයි. ඔවුන් තම සිතැඟියාවන්, පෞද්ගලික අදහස් ඉස්මතු කරලීමට දරන වෑයම හඳුනාගත හැකිය. මෙහිදී තම මතය සනාථ කෙරුමට අදාල මූලයන් හෝ තොරතුරු පමණක් යොදා ගැනීමට ඇති හැකියාව බෙහෙවින් වැඩිය. මෙරට ඉතිහාසකරණ සම්ප්‍රදාය ආරම්භයේ දී මෙන්ම වර්ධනයේ දී මෙම තත්ත්වය පැහැදිලිව හඳුනාගත හැකිය. රචකයාට යම් භික්ෂුවක් හෝ සිදුවීමක් හෝ පූජා වස්තුවක් හෝ ප්‍රදේශයක් ඉස්මතු කොට දැක්වීමට, විශේෂ කොට දැක්වීමට අවශ්‍ය නම් ඔහු එය සිදු කරයි. මෙහිදී එයට ආධාරක වන වටපිටාවේ පුද්ගලයන් හෝ සිදුවීම් දුබල කරමින් හෝ මෙය සිදුකරයි. මෙරට ඓතිහාසික සම්ප්‍රදාය වර්ධනයේ වැදගත්ම අවස්ථාවක් වන මහාවංසයේ මෙවැනි අවස්ථාවන් බොහෝ ප්‍රමාණයක් හඳුනාගත හැකිය. එක් නිදසුනක් ගතහොත් මහාවංස කර්තෘගේ අවශ්‍යතාවය පරිදි දුටුගැමුණු රජුගේ ශ්‍රේෂ්ඨත්වය ඉහළින් වර්ණනා කිරීමට ඔහුට සම්බන්ධ අනෙක් බොහෝ ප්‍රබල චරිත දුබල කර තිබේ. විශේෂයෙන්ම කාවන්තිස්ස රජතුමා හා සද්ධාතිස්ස කුමරු ආදීන්ව එතරම් වැදගත් තත්ත්වයෙහි සළකා නොමැත. නමුත් සැබෑ යථාර්ථය වන්නේ දුටුගැමුණු රජුගේ සටන් ව්‍යාපාරයට අවශ්‍ය ශක්තිමත් පදනම සකස් කර තිබෙන්නේ කාවන්තිස්ස රජුය. පසුකාලීන කෘතිවලින් ද බොහෝවිට රචකයන්ගේ පෞද්ගලික අවශ්‍යතා ඉස්මතු වන බව හඳුනාගත හැකිය.

- **කාල පරතරය**

මෙරට ඉතිහාසකරණ සම්ප්‍රදායෙහි වර්ධනය දෙස බලන විට රචනයන්හි හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ සිදුවීම් සිදු වූ කාලය හා එය රචනා කරන ලද කාලය අතර තිබෙන පරතරයයි. බොහෝ විට සියවස් කීපයක පරතරය හඳුනාගත හැකිය. මහාවංසය වැනි කෘති විමසීමේ දී ඒවායෙහි මුල් පරිච්ඡේදවල අන්තර්ගත තොරතුරු සිදු වූවා යැයි කියනු ලබන කාලයට වඩා සියවස් ගණනාවකට පසුව රචනා වී තිබෙන නිසා එබඳු පරතරයක් සහිත කාලයන්වලට අදාළ තොරතුරු පිළිගැනීමට අපහසු, විශ්වාස කළ නොහැකි, අතිශයෝක්තීන් අන්තර්ගත වන බව පැහැදිලිය. ඇතැම්විට සිදුවීම්වලට සමකාලීනව රචනා වී ඇති කෘතිවල ද බොහෝ අතිශයොක්තිගත තොරතුරු අන්තර්ගත බව දක්නට ලැබේ. කෙසේ වුවද අභිලේඛනයන් අදාළ සිදුවීම්වලට බොහෝ සෙයින් සමකාලීන බව ද අතිශයෝක්තිගත තොරතුරු අඩු බවට ද විශ්වාස කරන නිසා සාහිත්‍ය රචනයන්වලට වඩා අභිලේඛන වඩාත් විශ්වාසදායක යයි සාමාන්‍යයෙන් පිළිගනී.

මෙලෙස මහාවිහාරය කේන්ද්‍ර කොටගෙන ආරම්භ වූ මෙරට ඓතිහාසික සම්ප්‍රදාය කල්ගත වන විට සීඝ්‍ර දියුණුවක් සිදු වී තිබෙන බව පැහැදිලි වේ. මෙම වර්ධනයෙහි විවිධ පැතිකඩයන් සේම විවිධ ලක්ෂණ ද හඳුනාගත හැකිය. විශේෂයෙන්ම මෙම වර්ධනයෙහි වැදගත් අවස්ථාවක් වන මහාවංසය පසු කාලීනව ඉදිරියට පැමිණි බොහෝ ඓතිහාසික රචනාවන්ට පසුබිම් වී තිබෙන අතර එහි ආදර්ශ ගෙන බොහෝ කතෘවරුන් රචනයන් රාශියක් සිදු කර තිබෙන බව හඳුනාගත හැකිය. මෙරට ඉතිහාසකරණ සම්ප්‍රදායෙහි අනුක්‍රමික වර්ධනය විමසන විට දැකගත හැකි වැදගත්ම ලක්ෂණය නම් එය අඛණ්ඩවම පැවතගෙන පැමිණි සම්ප්‍රදායක් වීමයි. විශේෂයෙන්ම බෞද්ධ විහාරාරාම

කේන්ද්‍රකොටගෙන භික්ෂූන් අතින් ඇරඹෙන මෙම ඓතිහාසික සම්ප්‍රදාය අනතුරුව ඉතාමත් දියුණුවට පත් වේ. ගිහි-පැවිදි උගතුන් වෙතින් රචනයන් විශාල ප්‍රමාණයක් සිදු වේ. මේවා නිසා මෙරට අඛණ්ඩ ඉතිහාසකරණ සම්ප්‍රදායක් ගොඩනැගුණු බවට හඳුනාගත හැකි වේ. මෙරට පුරාතන ඉතිහාසකරණ සම්ප්‍රදාය ලෝකයේ වෙනත් ප්‍රදේශවල වර්ධනය වූ ඉතිහාසකරණ සම්ප්‍රදායන් මෙන් ඉතා වැදගත් වූ බව ද පැහැදිලිව හඳුනාගත හැකි වේ. නූතනය වන විට මෙරට ඉතිහාසය ගොඩනැගීමේ කාර්යයෙහිලා මෙකී අඛණ්ඩ ඉතිහාසකරණ සම්ප්‍රදායෙන් ලැබෙන පිටිවහල මෙතෙකැයි ප්‍රමාණ කළ නොහැකිය.

**සමාලෝචනය**

ඉතිහාසය මගින් අතීත මානව සිදුවීම්හි විවිධ පැතිකඩයන් නියෝජනය වන අතර ඉතිහාසකරණයෙන් එකී ඉතිහාසය සංගෘහිත කිරීම හඳුනාගත හැකිය. මෙම අවස්ථා ද්විත්වය එකිනෙකට වෙනස් අවස්ථාවන් දෙකක් වන අතර ලොව විවිධ රටවල ඉතිහාසකරණ ශික්ෂණ විවිධ ආකාරයෙන් ගොඩනැගෙනු හඳුනාගත හැකිය. දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන ශ්‍රී ලංකාව බුදු දහමේ බලපෑම හා ඉන්දියානු රචනාවන්හි ආභාෂය මත ඉතිහාසකරණ ශික්ෂණය වෙත ප්‍රවිශ්ට වී ඇති බව හඳුනාගත හැකි වේ. මුල් කාලීනව බෞද්ධාගමික මධ්‍යස්ථාන ආශ්‍රය කරමින් භික්ෂූණ් වහන්සේලා විසින් ඉතිහාසකරණය වෙත යොමු වී ඇති අතර බුදු දහමේ ඉතිහාසය මෙන්ම බුදු දහම සම්බන්ධ විවිධ අවස්ථා මූලික කරගනිමින් විවිධ රචනාවන් සිදු වී ඇති අතර එකී ආගමික රචනාවන්හි වැදගත් ඓතිහාසික තොරතුරු අන්තර්ගත වීම වැදගත්ය. විශේෂයෙන්ම බෞද්ධාගමික තොරතුරුවල නිරවද්‍යභාවය හා ඓතිහාසිකත්වය ඉස්මතු කරලීම සඳහා රජුන් හා සම්බන්ධ කරමින් තොරතුරු ඉදිරිපත් කිරීමට යුහුසුළු වී තිබේ. මුල්කාලීනව ඓතිහාසික තොරතුරු සම්පාදනයන් මහාවිහාර සම්ප්‍රදාය මූලික කොටගෙන පැවති අතර පසුව අභයගිරිය හා වෙනත් ආරාමයන් මූලික කරගෙන ද වර්ධනය වී ඇති බව හඳුනාගත හැකිය. මුල් කාලීනව මුඛ පරම්පරාගතව ද පසු කාලීනව ලිඛිතව ද මෙකී ඓතිහාසික සම්ප්‍රදාය වර්ධනය වූ ආකාරය දක්නට ලැබෙන අතර මුල් කාලීනව බුදු සසුණේ ඉතිහාසය හා සම්බන්ධ තොරතුරු ද පසුව පූජා වස්තූන් ආදී විවිධ අවස්ථා ගණනාවක් මූලික කරගෙන සංගෘහිත වූ රචනාවන් ද හඳුනාගත හැකිය. එමෙන්ම මෙකී ඉතිහාසකරණ සම්ප්‍රදාය වර්ධනය වීමේදී එකී රචනාවන් කෙරෙහි බලපෑ බාහිර සාධක ගණනාවක් පැවති බව ද දක්නට ලැබේ. ඓතිහාසික රචනාවන්හි අඩුපාඩු ගණනාවක් පැවතිය ද අඛණ්ඩ ඉතිහාසකරණ සම්ප්‍රදයක් ඇති රටවල් අතර ශ්‍රී ලංකාවට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයක් වන බව පැහැදිලිය. පුරාතන ශ්‍රී ලාංකේය ඉතිහාසකරණ සම්ප්‍රදාය විමසන විට මහාවංසයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයක් වන බව ද පැහැදිලි වේ. වසර දහස් ගණනක ඉතිහාසය අන්තර්ගත වන ආකාරයෙන්, අඛණ්ඩව ගලායන ආකාරයෙන්, කොටස් කීපයක් වශයෙන් මෙරට ඉතිහාසය සංග්‍රහ කර තිබෙන මහාවංසය නූතනය වන විට ලෝක උරුමයක් වශයෙන් ද යුනෙස්කෝ අයතනය විසින් ප්‍රකාශයට පත්කර තිබේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අදිකාරම්, ඊ. ඩබ්. (1963). **පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය**. දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

අමරසිංහ, කර්ත්බර්ට්. (2005). ''ලිවී : රෝම ඉතිහාසඥයෙක්'', **ඉතිහාසයේ අතීතය ශික්ෂණයක වර්ධනය පිළිබඳ විමර්ශනයක්**. සංස්. රණවීර ලෙස්ලි ගුණවර්ධන. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 46-75.

ඉලංගසිංහ, මංගල. (2003). **මහාවංසය හා ශ්‍රී ලංකාවේ ඉතිහාස සම්ප්‍රදාය**. මහරගම : තරංජි ප්‍රින්ටර්ස්.

කරුණාතිලක, බන්දුල. (2005). ''ඉස්ලාමීය ඓතිහාසික සම්ප්‍රදාය හා ඉබ්න් ඛල්දූන්ගේ ඉතිහාස කෘති'', **ඉතිහාසයේ අතීතය ශික්ෂණයක වර්ධනය පිළිබඳ විමර්ශනයක්**. සංස්. රණවීර ලෙස්ලි ගුණවර්ධන. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 173-201.

කිරිබමුණේ, සිරිමා. (2005). ''මහාවංශය හා ලක්දිව ඓතිහාසික සම්ප්‍රදායය'', **ඉතිහාසයේ අතීතය ශික්ෂණයක වර්ධනය පිළිබඳ විමර්ශනයක්**. සංස්. රණවීර ලෙස්ලි ගුණවර්ධන. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 105-135.

ගමගේ, ගුණසේන. (2019). **වංසත්ථප්පකාසිනී මහාවංස අර්ථ විවරණය පිළිබඳ විමර්ශනයක්**. දිවුලපිටිය : සරස්වතී ප්‍රකාශන.

ගුණවර්ධන, රණවීර ලෙස්ලි. (2005). ''ඉතිහාසයේ අතීතය : ඉතිහාසකරණය පිළිබඳ අධ්‍යයන ව්‍යාපෘතිය'', **ඉතිහාසයේ අතීතය ශික්ෂණයක වර්ධනය පිළිබඳ විමර්ශනයක්**. සංස්. රණවීර ලෙස්ලි ගුණවර්ධන, කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 1-11.

ගුණවර්ධන, රණවීර ලෙස්ලි. (2005). ''අපරදිග ඉතිහාස චින්තය හා ශික්ෂණයක වර්ධනය'', **ඉතිහාසයේ අතීතය ශික්ෂණයක වර්ධනය පිළිබඳ විමර්ශනයක්**. සංස්. රණවීර ලෙස්ලි ගුණවර්ධන. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 203-325.

ගුණවර්ධන, රණවීර ලෙස්ලි. (2005). ''කල්හණගේ රාජතරංගනිය හා භාරතීය ඓතිහාසික සම්ප්‍රදාය'', **ඉතිහාසයේ අතීතය ශික්ෂණයක වර්ධනය පිළිබඳ විමර්ශනයක්**. සංස්. රණවීර ලෙස්ලි ගුණවර්ධන. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 137-171.

චන්දවිමල හිමි, කලුන්දෑවේ. (2012). **ශ්‍රී ලංකාවේ සංස්කෘත අභිලේඛන හා සමකාලීන සමාජය**. වරකාපොල : ආරිය ප්‍රකාශකයෝ.

**දීපවංශය.** (1990). සංස්. කිරිඇල්ලේ ඥාණවිමල හිමි. කොළඹ : ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ධම්මරතන හිමි, උතුරාවල. (2009). **පාලි සාහිත්‍ය ඉතිහාසය**. නැදිමාල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පීරිස්, මර්ලින්. (2005). ''තුසිඩිඩීස් හා ග්‍රීක ඓතිහාසික සම්ප්‍රදායය'', **ඉතිහාසයේ අතීතය ශික්ෂණයක වර්ධනය පිළිබඳ විමර්ශනයක්**. සංස්. රණවීර ලෙස්ලි ගුණවර්ධන. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 13-44.

**පූජාවලිය.** (1953). පණ්ඩිත වේරගොඩ අමරමෝලි නා හිමියන්ගේ සංස්කරණය.

පෙරේරා. ලක්ෂ්මන් එස්. (1964). ''ලංකා ඉතිහාසයේ මූලාශ්‍රයෝ'', **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, 1 කාණ්ඩය,** සංස්. හේමචන්ද්‍ර රායි සහ තවත් අය. කොළඹ : විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය. 46-72.

බලගල්ල, විමල් ජී. (1958). **බෞද්ධ රාජධානි පිළිබඳ තොරතුරු නම් වූ ෆාහියන්ගේ දේශාටන වාර්තාව (සිංහලානුවාදය).** ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (2012). **පාලි සාහිත්‍යය**. කොළඹ : රත්න පොත් ප්‍රකාශකයෝ.

**මහාවංසය.** (2018). සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ පඬිතුමන්, දෙහිවල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**මහාවංස ගීතය.** (1993). සංස්. මහානාම දිසානායක සහ ඩබ්. වී. අභයගුණවර්ධන, , බත්තරමුල්ල : සංස්කෘතික කටයුතු දෙපර්තමේන්තුව.

මෙන්ඩිස්, ජී. සී. (1966). **ලංකා ඉතිහාසයේ ගැටලු**. පරි. නීල් ශ්‍රී විජයසිංහ. කොළඹ : ඇපොතිකරීස් සමාගම.

රතනසාර හිමි, කවුඩාගම්මන. (2017). ''ශ්‍රී ලාංකේය ඓතිහාසික තොරතුරු සම්පාදනය කරලීමේ මූලික අවස්ථාව බෞද්ධ විහාරාරාම කේන්ද්‍ර කොට සිදු විය'', **විදුවස ශාස්ත්‍රීය සංග්‍රහය මිනුවන්ගමුව විද්‍යාවාස මහ පිරිවෙනට වසර 75 ක් සපිරීම නිමිත්තෙනි**. සංස්. රණව ධම්මකිත්ති හිමි සහ තවත් අය. විද්‍යාවාස මහ පිරිවෙන. 538-567.

**වංසත්ථප්පකාසිනිය**. (1994). මහාවංශ ටීකාව-සිංහල අනුවාදය. අකුරැටියේ අමරවංශ නාහිමි සහ හේමචන්ද්‍ර දිසානායක.

වික්‍රමසිංහ, සිරිමා. (1987). ''ඓතිහාසික මූලාශ්‍ර ස්වදේශීය සාහිත්‍ය කෘති'', **අනුරාධපුර යුගය.** සංස්. අමරදාස ලියනගමගේ සහ රණවීර ගුණවර්ධන. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 1-22.

වේරකේ, මහින්ද. (2005). ''ස-මා චියන් සහ ග්‍රීක ඓතිහාසික සම්ප්‍රදායය'', **ඉතිහාසයේ අතීතය ශික්ෂණයක වර්ධනය පිළිබඳ විමර්ශනයක්**. සංස්. රණවීර ලෙස්ලි ගුණවර්ධන. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. 77-103.

**සමන්තපාසාදිකා.** (1929). සංස්. පියරත්න ස්ථවිර හා සෝරත ස්ථවිර. I කාණ්ඩය. කොළඹ.

**සිංහල ථූපවංශය**. (1990). සංස්. බලගල්ලේ විමලබුද්ධි හිමි සහ විමල විජේසූරිය. කොළඹ : රත්න පොත් ප්‍රකාශකයෝ.

සෝමතිලක, මහින්ද. (2020). **ශ්‍රී ලංකාවේ ඉතිහාසය රචනා කිරීම මූලාශ්‍ර භාවිතය සහ අර්ථකථන සැපයීම**. කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

**Culavamsa**. (1958). tr. W. Geiger, Colombo : Ceylon Government Information Department.

**Vamsatthapakasini**. (1935). ed. G. P. Malalasekara. London : pali Text society.

**Dipavamsa**. (1879). ed. H. Oldernberg. London : pali text society.

Philips, C.H. (1961). **Historions of India, Pakistan and Ceylon**. London : Oxford University Press.

Geiger, W. (1908). **Dipavamsa and Mahavamsa and other Historical Developments in Ceylon**. (trsl.) E. M. Coomarasamy. Colombo.